ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන

**HRC2405** - මානව සම්පත් කළමනාකරණය සඳහා ආර්ථික ප්‍රවණතා

අවසාන පරීක්ෂණය - **2025**

කාලය - පැය තුනයි **(03)**

---

දිනය: **30/08/2025** | වේලාව: පෙ.ව **09.30** - ප.ව **12.30**

---

උපදෙස්: ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න . සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ

ප්‍රශ්න අංක **01**

(අ) (i). උචිත උදාහරණ යොදා ගනිමින් "සූක්ෂම"(Micro) සහ "සාර්ව"(Macro) ආර්ථික විද්‍යාව අතර වෙනස දක්වන්න.

(ලකුණු 04)

(ii) "හිඟකම" (Scarcity) යනු සංවර්ධනය වෙමින් පවතින රටවල් පමණක් මුහුණ දෙනු ලබන මූලික ප්‍රශ්නයකි." ඔබ එකඟ වන්නේද? උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න (ලකුණු 05)

(ආ) (i) නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර (PPC) විශ්ලේෂණයේදී යොදා ගන්නා උපකල්පන මොනවාද? පැහැදිලි කරන්න.

(ලකුණු 04)

(ii) නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර විශ්ලේෂණය ඇසුරින් පහත කරුණු පැහැදිලි කරන්න. පිළිතුර පැහැදිලි කිරීම සඳහා රූප සටහන් යොදා ගන්න.

- අවස්ථික පිරිවැය (Opportunity Cost)
- ඌන සම්පත් උපයෝජනය (Inefficient Allocation of Resources)

(ලකුණු 05)

(iii) "ආර්ථික පරිසරය තේරුම් ගැනීම කළමනාකරුවන්ට සඵලදායි තීරණ ගැනීමට උපකාරී වේ." උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

**ප්‍රශ්න අංක 02**

(අ) (i) අර්ථ දක්වන්න

- ඉල්ලුම් ප්‍රමාණය (Quantity Demand)
- ඉල්ලුම (Demand)
- සඵලදායි ඉල්ලුම (Effective Demand)

(ලකුණු 06)

(ii) මිලෙහි කාර්යයන් මොනවාද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ආ)ඉල්ලුම සහ සැපයුම් වක්‍ර විශ්ලේෂණය ඇසුරින් පහත දක්වා ඇති වෙනස්කම් අදාළ වෙළඳපොළට බලපාන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. පිළිතුර පැහැදිලි කිරීම සඳහා රූප සටහන් යොදා ගන්න.

(i) කිරිපිටි පරිභෝජනය කිරීම මිනිස් සෞඛ්‍යයට අහිතකර වන බව වෛද්‍ය වාර්තාවකින් දක්වා තිබීම. නැවුම් එළකිරි සඳහා වෙළඳද පොළ
(ii) තාක්ෂණික දියුණුව නිසා වී නිෂ්පාදනයේදී පසු අස්වනු හානිය අඩුවීම. සහල් සඳහා වෙළඳපොළ.
(iii)බේකරි කර්මාන්තය සඳහා යොදා යොදාගන්නා යෙදවුම් මිල ඉහළ ගොස් ඇත. බේකරි නිෂ්පාදන සඳහා වෙළඳ පොළ.

(ලකුණු 09)

(ඇ) විදුලි උපකරණ මිල අනාගතයේදී ඉහළ යනු ඇතැයි ජනතාව බලාපොරොත්තු වෙයි. මෙම තත්ත්වය විදුලි උපකරණ වෙළඳපොළ කෙරෙහි බලපාන්නේ කෙසේද? රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)
(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක **03**

(අ) (i) ශ්‍රමයට ඇති ඉල්ලුම ව්‍යුත්පන්න ඉල්ලුමක් (Derived Demand) ලෙස සලකන්නේ ඇයි? රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) රජයේ රෙගුලාසි උදා අවම වැටුප් (Minimum Wage Levels) හඳුන්වාදීම, ශ්‍රම වෙළෙඳපොළ කෙරෙහි බලපාන්නේ කෙසේද? රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඇඟලුම් කර්මාන්තයේ තාක්ෂණික දියුණුව, පුහුණු යන්ත්‍ර ක්‍රියාකරුවන්ගේ ශ්‍රම වෙළඳපොළ කෙරෙහි බලපාන්නේ කෙසේද? (ලකුණු 05)

(ආ ) (i) තොරතුරු තාක්ෂණ වෘත්තිකයන් විශාල ප්‍රමාණයක් රට හැරයාම, තොරතුරු තාක්ෂණ වෘත්තිකයන්ගේ රැකියා වෙළඳපොළ කෙරෙහි බලපාන්නේ කෙසේද? රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ඇඟලුම් කර්මාන්තයේ නියුතු ආයතන සිය සේවකයින් සඳහා අතුරු ප්‍රතිලාභ ලබාදීම වැඩිකර ඇත. මෙම තත්ත්වය ඇඟලුම් කර්මාන්ත ශ්‍රම වෙළඳපොළ කෙරෙහි බලපාන්නේ කෙසේද?

(ලකුණු 05)

(මුළු ලකුණු 25)

ප්‍රශ්න අංක **04**

(අ) (i) අර්ථ දක්වන්න

- ශ්‍රම ඉල්ලුම් නම්‍යතාවය (Elasticity of Demand for Labour)
- ශ්‍රම සැපයුම් නම්‍යතාවය (Elasticity of Demand for Supply)

(ලකුණු 06)

(ii) යම් නිශ්චිත ශ්‍රම සම්පතක් සඳහා ඉල්ලුම සහ සැපයුම නම්‍ය(elastic) වන්නේ නම්, ශ්‍රම සැපයුම අඩුවීම අදාල ශ්‍රම වෙළඳපොළ කෙරෙහි බලපාන්නේ කෙසේද? ප්‍රස්ථාරයක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) (i) "පූර්ණ තරගකාරී වෙළඳපොළ"(Perfectly Competitive) සහ "කරීපයාධිකාරී වෙළඳපොළ" (Monopolistically Competitive) අතර සමාන අසමානකම් දක්වන්න.

(ලකුණු 06)

(ii) පූර්ණ තරගකාරී ශ්‍රම වෙළඳපොළකදී සේවකයින් සහ ආයතන වැටුප් භාරගන්නන් වන්නේ ඇයි? රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 07)

(මුළු ලකුණු 25)

**ප්‍රශ්න අංක 05**

(අ) (i) ව්‍යාපාරික චක්‍රය (Business Cycle) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? රූප සටහන් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ii) "චක්‍රීය විරැකියාව" (Cyclical Unemployment) යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iii) අර්ථ දක්වන්න.

- විරැකියා අනුපාතය (Unemployment Rate)
- ශ්‍රමදායකත්ව අනුපාතය (Labour Force Participation Rate)

(ලකුණු 05)

(ආ) (i) ආර්ථික වර්ධනයේ (Economic Growth) මූලාශ්‍ර දක්වන්න.

(ලකුණු 05)

(ii) ආර්ථික වර්ධනයේ පිරිවැය (Costs) කුමක්ද? පැහැදිලි කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

-සියලුම හිමිකම් ඇවිරිණි-